(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 206.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2017 ඔක්තෝබර් මස 20 සිකුරාදා පූ. භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **රවි කරුණානායක මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **සිරිපාල ගමලත් මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා**

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා**

ගරු **මලිත් ජයතිලක මහතා**

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා**

ගරු **පියංකර ජයරත්න මහතා**

ගරු **ලකී ජයවර්ධන මහතා**

ගරු **මයිල්වාගනම් තිලකරාජා මහතා**

ගරු **ක. තුරෙයිරෙත්නසිංහම් මහතා**

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා**

ගරු **එම්. එස්. තෞෆික් මහතා**

ගරු **සිරිනාල් ද මෙල් මහතා**

ගරු **ටී. රංජිත් ද සොයිසා මහතා**

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු විමල් රාජපක්ෂ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

නීල් ඉද්දවල මහතා, වැඩ බලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2017 ඔක්තෝබර් 19 වැනි දින ම'විසින් 'රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන)' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා සීමාසහිත සී-නෝර් පදනමේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම** : (1) ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු වමල් රාජපක්ෂ මහතා වෙනුවෙන් එහි සභික ගරු ජේ. සී අලවතුවල මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද, (203 අධිකාරය වූ) මෝටර් වාහන පනත යටතේ නියෝග සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව, පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු මලිත් ජයතිලක මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2012 සහ 2013 වර්ෂ සඳහා ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික වාර්තා;

(ii) 2015 වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2011, 2012, 2013 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(iv) 2011, 2012, 2013 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා; සහ

(v) 2002, 2003, 2004, 2005, 2006, 2007, 2008, 2009, 2010 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම්** :

(1) රත්නපුර, ගැටන්ගම, අංක 201/04 දරන ස්ථානයෙහි පදිංචි කේ. ඒ. දුමින්ද කුමාර මහතාගෙන් ලැබුණු 2017.06.23 දිනැති පෙත්සම ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(2) (i) කළුතර, කලමුල්ල, ගාලු පාර, අංක 45 දරන ස්ථානයෙහි පදිංචි ඒ. එච්. කේ. එන්. අරවින්ද මහතාගෙන් ලැබුණු 2017.08.31 දිනැති පෙත්සම;

(ii) පන්නිපිටිය, සිල්වා පෙදෙස, අංක 484/20ඒ දරන ස්ථානයෙහි පදිංචි දමින්ද වෙදගේ මහතාගෙන් ලැබුණු 2017.09.07 දිනැති පෙත්සම;

(iii) මාතර, සුල්තානාගොඩ, කදුරුගස් අද්දර යන ලිපිනයෙහි පදිංචි එම්. ගුණසේකර මහතාගෙන් ලැබුණු 2017.08.16 දිනැති පෙත්සම;

(iv) අකුරැස්ස, තිබ්බොටුවාව, මුත්තෙට්ටුහේන, අංක 38/14ඩී දරන ස්ථානයෙහි පදිංචි පී.එම්. දිල්කි මදූෂානි මෙනවියගෙන් ලැබුණු 2017.08.29 දිනැති පෙත්සම; සහ

(v) රත්මලේ, නෙළුම් වැව, "සිසිර සෙවන" යන ලිපිනයෙහි පදිංචි රොමියෙල් නම්බුහේවා මහතාගෙන් ලැබුණු 2017.07.21 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) ගල්පාත, බටගොඩ, අංක 3/51 දරන ස්ථානයෙහි පදිංචි එම්. කළණ පීරිස් මහතාගෙන් ලැබුණු 2017.08.27 දිනැති පෙත්සම ගරු මලිත් ජයතිලක මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) :** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— අනපේක්ෂිත සහ හදිසි අවස්ථාගත කරුණු හේතුකොට ගෙන ඡන්ද විමසීම් පැවැත්වීම කල් තබනු ලැබූ උතුරු පළාතේ ප්‍රාදේශීය සභා දෙකක් සම්බන්ධයෙන් අලුතින් නාමයෝජනා කැඳවීම සඳහා සහ ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**6. පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2018 විසර්ජන පනත් කෙටුම්පතේ වැඩ කටයුතු සඳහා අංක 70(1) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයේ සඳහන් "විසි හය" යන වචන වෙනුවට "විසි හතර" යන වචන ආදේශ කිරීමෙන් ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2017 නොවැම්බර් මස 10 වැනි සිකුරාදා, 11 වැනි සෙනසුරාදා, 13 වැනි සඳුදා, 14 වැනි අඟහරුවාදා, 15 වැනි බදාදා සහ 16 වැනි බ්‍රහස්පතින්දා "විසර්ජන පනත් කෙටුම්පත (2018)" සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 70(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2018)" සලකා බැලීම සඳහා 2017 නොවැම්බර් මස 10 වැනි සිකුරාදා, 11 වැනි සෙනසුරාදා සහ 13 වැනි සඳුදා සිට 15 වැනි බදාදා දක්වා වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 7.30 දක්වා ද විය යුතු ය:

එතකුදු වුවත්, අ. භා. 7.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) සහ (6) ඡේද ක්‍රියාත්මක විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 70(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, “විසර්ජන පනත් කෙටුම්පත (2018)” සලකා බැලීම සඳහා වෙන් කළ, 2017 නොවැම්බර් මස 16 වැනි බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 5.00 දක්වා ද විය යුතු ය. අ. භා. 5.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා, ගරු ඉම්රාන් මහරූෆ් මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

“හේෂා මිත්‍රත්ව පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.”

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**11. මෝටර් වාහන පනත යටතේ නියෝග :** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වගන්තියේ (2) උපවගන්තිය සහ 19 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 22 දිනැති අංක 2037/ 23 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත, 2017 සැප්තැම්බර් 08 දිනැති අංක 2035/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.10.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(පූ. භා. 11.45 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

(අ. භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

“ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය”යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.37 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

“ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය”යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.15 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 4.07 ට, 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.